රුහුණ විශ්වවිද්‍යාලය

2015/2016 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 2000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2017 මාර්තු

**BCU 22623** – භාරතීය බෞද්ධ ඉතිහාසය (අශෝක යුගය තෙක්)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01. බුදුරජාණන් වහන්සේගේ ඓතිහාසිකත්වය පිළිබඳ ත්‍රිපිටකාගත මූලාශ්‍රය ඇසුරින් හෙළිවන සාධක ගෙනහැර දක්වන්න.

02. බුද්ධකාලීන භාරතයේ පැවති සමෘද්ධිමත් ආර්ථික තත්වය බුදුසමය සමාජගත කිරීමෙහි ලා ඉවහල් වූ ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.

03. සදාචාරාත්මක දේශපාලන ප්‍රතිපත්ති අන්තර්ගත වූ පාලන ව්‍යුහයක් ගොඩනගා ගැනීමට අශෝක ධර්මය හේතු වූයේ කෙසේදැයි පැහැදිලි කරන්න.

04. ක්‍රි.පූ. 6 වන සියවසේ භාරතීය දේශපාලන පසුබිම පිළිබඳව සමාලෝචනයක යෙදෙන්න.

05. සංගායනාවක් යනු කුමක්දැයි හඳුන්වා ප්‍රථම ධර්ම සංගායනාව සඳහා බලපෑ හේතු හා එහි ප්‍රතිඵල පිළිබඳව විස්තරයක් කරන්න.

06. බුදු සමය ව්‍යාප්ත කිරීමෙහි ලා මොග්ගලීපුත්තතිස්ස හිමියන් හා ධර්මාශෝක අධිරාජයා විසින් සිදුකළ සේවය පිළිබඳ ඇගයීමක් කරන්න.

07. සංඝ සමාජයේ ආරම්භය පිළිබඳව මහාවග්ගපාළිය ඇසුරින් අධ්‍යයනයක් කොට මුල්කාලීන සංඝ සමාජයේ ව්‍යුහය පිළිබඳව හැඳින්වීමක් කරන්න.

08. පහත සඳහන් මාතෘකා දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

i. සංශයවාදය

ii. මෞර්ය අධිරාජ්‍යය

iii. ඉන්දීය ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය

iv. නිකාය භේදය

(එක් පිළිතුරකට ලකුණු 15 බැගිනි.)

@@@@@@@